# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1636/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 29/12/2023<br>පැය 1120 |

## මාධ්‍ය නිවේදනය

### 01. හෙරොයින් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.

2023.12.28 වන දින රාත්‍රී කාලයේදී මට්ටක්කුලය පොලිස් වසමේ කදිරාන පාලම ප්‍රදේශවලදී මට්ටක්කුලය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 22 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන හැදල, තොටුපොල පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

### 02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තිරුක්කෝවිල් පොලිස් ස්ථානය.

2023.12.28 වන දින දහවල් කාලයේ තිරුක්කෝවිල් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තිරුක්කෝවිල් පොලිස් වසමේ කංචිකුඩිආරු ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන කංචිකුඩිආරු ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තිරුක්කෝවිල් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොලොන්න පොලිස් ස්ථානය.

2023.12.28 වන දින දහවල් කාලයේ කොලොන්න පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කොලොන්න පොලිස් වසමේ දඹේමඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන දඹේමඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොලොන්න පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සිලාවතුර පොලිස් ස්ථානය.

2023.12.28 වන දින උදෑසන කාලයේ සිලාවතුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සිලාවතුර පොලිස් වසමේ සුන්දිකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන කරඩික්කුලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිලාවතුර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. නාඳුනන මළ සිරුරක් - වැලිපැන්න පොලිස් වසම.

2023.12.28 වන දින දහවල් කාලයේදී වැලිපැන්න පොලිස් වසමේ 05 කණුව, පල්ලේගොඩ මාර්ගයේ නාඳුනන මළ සිරුරක් ඇති බවට වැලිපැන්න පොලිස් ස්ථානයට ලද නිර්නාමික පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**රූප විස්තර - වයස අවුරුදු 35-40 ක් පමණ වන උස අඩි 05 අඟල් 02 ක් උසැති උඩු රැවුල හා යටි රැවුල වවා ඇති පිරිමි පුද්ගලයෙකි. උඩුකයට කහ පැහැති අත්කොට කමිසයක් සහ යටිකයට තැඹිලි පැහැති ඉරි සහිත සරමක් හැඳ ඇත.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු කළුතර නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැලිපැන්න පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හදිසි ගින්නක් - වැල්ලම්පිටිය පොලිස් වසම.

2023.12.28 වන දින දහවල් කාලයේදී වැල්ලම්පිටිය පොලිස් වසමේ කොලොන්නාව මාර්ගයේ පිහිටි ගොඩනැගිල්ලක හදිසි ගින්නක් හටගෙන ඇති බවට වැල්ලම්පිටිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

වැල්ලම්පිටිය පොලිසිය, ගිණි නිවීම් සේවා දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් එක්ව ගින්න සම්පුර්ණයෙන් මැඩපවත්වා ඇති අතර ගින්නට මැදිව සිටි සේවකයෙකු බේරාගෙන කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරිමට කටයුතු කර ඇත. ගින්න හේතුවෙන් මෙම ගොඩනැගිල්ලේ පලමු මහල හා දෙවන මහල තිබු මුළුතැන්ගෙයි උපකරණ විනාශ වී ඇති අතර දෙවන මහල ද ගිණිගෙන අලාභ සිදු වී ඇත. ගින්න හේතුවෙන් ජිවිත හානි කිසිවක් සිදුව නොමැත. ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශනය සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**